කැළණිය අධ්‍යාපන කලාපය.

දෙවන වාර ඇගයීම – 2016

ශ්‍රේණිය - 11 | විෂය - නර්තනය (දේශීය) | පත්‍රය - i, ii | කාලය පැය 03

නම : ............................................................................................ විභාග අංකය : ..................................

---

* i කොටසේ 1 සිට 40 දක්වා සියළුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

* අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X) ලකුණ යොදන්න.

---

## i වන කොටස

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න වල හිස් තැන් වලට සුදුසු වචන තෝරන්න.

1. උඩරට නර්තන සම්ප්‍රදායේ මුල්ම චලන අභ්‍යාසය සඳහා ...................... යොදා ගනී.
(1) පා සරඹ (2) දොඹින පද (3) ගොඩ සරඹ (4) ඉලංගම් සරඹ

2. තාලයක් අනුව ගීතයක් ප්‍රස්ථාර කිරීමේදී අවධානය යොමු කළ යුතු මාත්‍රා වර්ග දෙක ...................... ලෙස හැඳින්විය හැකිය.
(1) තිත්, තෙයි (2) මාත්‍රා 2 + 3 (3) ග්‍රහ, ලය (4) ලඝු, ගුරු

3. උඩරට සහ සබරගමු සම්ප්‍රදායන් දෙකෙහි වන්නම් වල නාමික වශයෙන් සමාන බව ...................... යන වන්නම් වලින් පැහැදිලි වේ.
(1) නෛයඩි, තුරඟා (2) සැවුලා, හනුමා (3) මුසලඩි, වෛරෝඩි (4) හනුමා, වෛරෝඩි

4. අංග, ප්‍රත්‍යාංග, උපාංග වශයෙන් කොටස් තුනක් දැක්වෙන්නේ, ...................... ය.
(1) ආංගික අභිනයේ දී (2) වාචික අභිනයේ දී (3) සාත්වික අභිනයේ දී (4) ආහාර්ය අභිනයේ දී

5. නර්තන, ගායන, වාදන හා රංගන අවස්ථා එක්තැන් වී ඇත්තේ, ...................... යි.
(1) ලලිත කලාව (2) නර්තන කලාව (3) ප්‍රාසාංගික කලාව (4) රංගන කලාව

6. අවකාශ භාවිතය සංකල්පයේ කොටස් දෙක ලෙස ...................... හැඳින්විය හැකිය.
(1) උඩ හා මැද (2) ඉදිරිපස හා පසුපස (3) උඩ හා යට (4) පොදු හා පුද්ගල

7. පැරණිතම ප්‍රශස්ති කාව්‍යයක් වන පැරකුම්බා සිරිතෙහි සඳහන් රජු වන්නේ, ...................... ය.
(1) මහා පරාක්‍රමබාහු රජු (2) ii වන පරාක්‍රමබාහු රජු
(3) vi වන පරාක්‍රමබාහු රජු (4) iii වන පරාක්‍රමබාහු රජු

8. රම්මොලවක අදිකාරම් විසින් රචිත ප්‍රශස්ති ග්‍රන්ථයකි, ......................
(1) නරේන්ද්‍රසිංහ වර්ණනාව (2) ශ්‍රී නාමය
(3) ශෘංගාලංකාරය (4) පවන

9. ...................... මෙම සංකේත ප්‍රස්ථාරකරණයේ දී මූලධර්ම ලෙස භාවිතා කරයි.
(1) ‿ + ∧ / (2) _ _ _ _ (3) + ∨ / ∨ (4) • ∨ / ∧

10. කඩු සරඹ නැටුම සකස් කිරීම සඳහා ...................... උපයෝගී කර ගනී.
(1) ප්‍රශස්ති ගී (2) චාමර ගී (3) හටන් ගී (4) ග්‍රහපංති ගී

• පහත දැක්වෙන රූප ඇසුරෙන් අංක 11 සිට 13 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C

11. A රූපයෙන් දැක්වෙන චරිතය වන්නේ,
(1) ආඬිගුරු (2) පරයා (3) ජසයා (4) සොත්තානා

12. ''ගුම් දැහිං ගුද ගුද දැහිං'' යන බෙර පදයෙන් සභාවට එන චරිතය දැක්වෙන රූපය වන්නේ,
(1) A (2) B (3) C (4) AB

13. C රූපයේ දැක්වෙන චරිතයේ වයෝවෘධ බව දැක්වෙන්නේ,
(1) සතර අභිනයෙන් (2) චලන වලින් (3) රිද්මයෙන් (4) තාලයෙන්

14. වන්නමෙහි කවිය ගායනා කරන අයුරු දක්වන යතුර වනුයේ,
(1) කස්තිරම (2) තානම (3) බෙර පදය (4) තිත

15. ''ජිංගත ගො ගො'' බෙර පදය ගසමින් නර්තනය කරන වන්නම වනුයේ,
(1) හනුමා වන්නම (2) තුරංගා වන්නම (3) වෛරොඩි වන්නම (4) සැවුලා වන්නම

16. ''ඉසිදුන් දෙවි කළ සතොසින'' මෙහි ''ඉසිදුන්'' යනු,
(1) ශක්‍ර දේවේන්ද්‍රයා (2) ඊශ්වර දෙවිඳුන් (3) මහා බ්‍රහ්මයා (4) රාහු අසුරේන්ද්‍රයා

17. චරිත නිරූපණයේදී අවධානය යොමු කළ යුතු කරුණකි,
(1) විවිධ භාව ප්‍රකාශ කිරීම (2) උචිත චලන
(3) නර්තන මාධ්‍ය උපයෝගී කර ගැනීම (4) ඉහත කී සියල්ලම

18. ''හනික වරෙව් කොල්ලනේ '' ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ,
(1) සුගතපාල සිල්වාගේ ''බෙර හඬ'' නාට්‍යය (2) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ''බෙර හඬ'' නාට්‍යය
(3) බන්දුල ජයවර්ධනයන්ගේ ''බෙර හඬ'' නාට්‍යය (4) බන්දුල ගුණවර්ධනයන්ගේ ''බෙර හඬ'' නාට්‍යය

19. සිංහල හා දෙමළ ගැමි නැටුම් සමාන බව දක්වන පිළිතුර වන්නේ,
(1) ලී, කළ - පින්නල් කෝලාට්ටම්, කරගම් (2) කුළු, ගොයම් - සුලකු, කෝලාට්ටම්
(3) ගොයම්, ලී - සුලකු, වෙම්බු (4) ලී, කුළු - කෝලාට්ටම්, සුලකු

20. ''ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන ඔබේ සිරිපා දොවන්නම්'' ගී පදය නර්තනයේ යෙදීමේදී මතුවන රසය වන්නේ,
(1) ශාන්ත රසය (2) වීර රසය (3) අද්භූත රසය (4) ශෘංගාර රසය

• 21 - 25 තෙක් ප්‍රශ්න වල නොගැළපෙන පදය තෝරන්න.

21. අඬ බෙර, රණ බෙර, මඟුල් බෙර, වද බෙර

22. ග්‍රහ පන්ති, බලි ශාන්තිකර්මය, අත් මිනිය, තාලම්පට

23. මල් යහන් කවි, ජන කවි, කඩතුරා කවි, සිරස පාද කවි

24. මන්කඩ් රාල, ආඬි ගුරු, පරයා, සොත්තානා

25. මිටි රියන, විගුස්ස, අඟුල, තුන් වියත් තුනඟුල

26. "හිරු දෙවි මේ ඔබට දෙන් සෙත සලසා" මෙය,
(1) සිරස පාද කවි ගායනයේ දී එන හිරුට ගැයෙන කවියකි
(2) කුළු කවි ගායනයේ දී එන හිරුට ගැයෙන කවියකි
(3) සෙත් කවි ගායනයේ දී එන හිරුට ගැයෙන කවියකි
(4) ග්‍රහ පන්ති ගායනයේ දී එන හිරුට ගැයෙන කවියකි

27. ව්‍යුහගත රිද්මය ලෙස හැඳින්වෙන්නේ,
(1) තාලයයි (2) පාලනය කළ රිද්මයයි (3) රිද්මය (4) කණ්ඩලම

28. "තත් පිත් තොං නං තා" කස්තිරම නටනු ලබන වට්ටම වනුයේ,
(1) කුද කුජී ගත වට්ටම (2) කුදාන්ත ගත දොං වට්ටම
(3) දොංජිංත ගත දොංත වට්ටම (4) කුද දොංත වට්ටම

29. කවාකාර රංග මඬලක් භාවිතා කරනුයේ,
(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මය සඳහා (2) කෝලම් නාට්‍ය සඳහා
(3) කෝලම් සහ නාඩගම් නාටක සඳහා (4) නාඩගම් නාටකය සඳහා

30. රජයේ පාසල් වල 6 - 11 දක්වා ශ්‍රේණි වල සෞන්දර්ය විෂය ඉගැන්වීම ආරම්භ වූයේ,
(1) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ (2) 1974 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ
(3) 1975 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ (4) 1978 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ

31. රන් විලි දෙකොනට තබා සකසා ඇති උපකරණය වන්නේ,
(1) දෑකැත්ත (2) කඩුව (3) මෝල්ගස (4) චාමරය

32. අංග රචනයක් කිරීමේදී මුහුණ මූලික වශයෙන් කොටස් ..................... බෙදේ.
(1) දෙකක ට (2) හතරක ට (3) හයක ට (4) පහක ට

33. "තත් තොග තක තොග ......................................... තක තොග" හිස් තැනට සුදුසු වචනය වන්නේ,
(1) තරිකිට තක තොග (2) තරිකිට තක්කඩ (3) තක්කඩ තරිකිට (4) තකට ජිකට

34. "තකට කුදට" මෙය,
(1) බෙර පදයකි (2) බෙර සරඹයකි (3) නිර්මාණ පදයකි (4) සරඹයකි

35. 12 /12 /1 2 3 4 ......... මෙය,
(1) සුළු මහ දෙතිතයි (2) දෙසුළු මහ තුන්තිතයි (3) දෙසුළු මහ දෙතිතයි (4) දෙසුළු මැදුම් තුන්
තිතයි

36. පැනිම් සරඹයෙහි කස්තිරම වන්නේ,
(1) තත් තත් තක්කඩ තරිකිට (2) තක්කඩ තරිකිට ජිජිකුද
(3) තකට තකට තක තරිකිට කුද කුද (4) ජික්කඩ තරිකිට ජිජිකුද

37. "තාකු තක්කුං තරිකිට තකුද තක් ජෙං ........" මෙය,
(1) දෙතිතට අයත් වන්නමක අඩව්වක කොටසකි (2) දෙතිතට අයත් වට්ටමක කස්තිරමක කොටසකි
(3) දෙතිතට අයත් වට්ටමක අඩව්වක කොටසකි (4) දෙතිතට අයත් වන්නමක කස්තිරමක කොටසකි

38. මුසලඩි වන්නමෙහි ඇති සුවිශේෂීතාවයක් වන්නේ,
(1) තනි තිතේ ස්වරූපයෙන් නැටීම (2) තාල රූප දෙකක් දක්නට තිබීම

(3) තුන් තිතක ලක්ෂණ දක්නට තිබීම (4) දෙතිතේ ස්වරූපයෙන් නැටීම

39. සුර අසුර යුද්ධයෙන් අසුරන් ජය ගත් යැයි ප්‍රකාශිත වන්නම වනුයේ,
(1) වෛරෝඩි වන්නම (2) තුරඟා වන්නම (3) සැවුලා වන්නම (4) මුසලඩි වන්නම

40. ගායනය රහිත උඩරට සාම්ප්‍රදායික නර්තන අංගයකි
(1) අස්නේ (2) ගුරුගේ මාලාව (3) හත්පද (4) කොහොඹා හැල්ල

විෂය - නර්තනය (දේශීය)

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න හයෙන් හතරකට පමණක් පිළිතුරු ලියන්න.

---

ii වන කොටස

1. (1) ප්‍රකාශන මාධ්‍යයෙන් ප්‍රබල දේශීය නර්තන සම්ප්‍රදාය වනුයේ, .................................... නර්තන සම්ප්‍රදායයි.

(2) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා .................................... නමින් හඳුන්වයි.

(3) ගැටබෙරයෙහි ඇස වටේට වෙළුම් සහිතව නිමවා ඇති කොටස .................................... වේ.

(4) කුළු නැටුම සඳහා .................................... වර්ණනාවේ කවි යොදා ගනු ලබයි.

(5) ශාන්ති කර්ම පැවැත්වීමට ප්‍රථමයෙන් සිදු කරන මූලික චාරිත්‍රයකි, ....................................

(6) නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිතා කරන ආකාරය ලියා දැක්වීම .................................... යි.

(7) ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාව පිළිබඳ ප්‍රබෝධයක් ඇති වූයේ, .................................... තුමාගේ පැමිණීමෙන් පසුව ය.

(8) වන්නම් පිළිබඳව තොරතුරු ඇතුළත්ව රචනා වී ඇති ග්‍රන්ථයකි, ....................................

(9) අංග රචනය සඳහා යොදා ගන්නා උපකරණ දෙකකි .................................... , ....................................

(10) අස්නේ නර්තනය සඳහා යොදා ගන්නා රංග භාණ්ඩ දෙක වනුයේ, .................................... හා ................................ යි.

2. පහත සඳහන් මාතෘකා වලින් **තුනකට** කෙටි සටහන් ලියන්න.

(1) සතර බීජාක්ෂර (2) කවිකාර මඩුව
(3) දේශීය වාද්‍ය භාණ්ඩ (4) ශාන්ත රසය
(5) සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ

3. (1) 2 + 2 + 3 තාලයට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ල 4)
(2) 2 + 4 තාල රූපයට අයත් වන්නමෙහි කවියක් ප්‍රස්ථාර කරන්න. (ල 4)
(3) මාත්‍රා 04 ට අයත් අඩව්ව ප්‍රස්ථාර කරන්න (ල 4)

4. (1) "දිගින් මඩුව සැට රියන යි
පුළුල් එකුළ තිස් රියන යි
තලව්වේ උස පස් රියන යි
කළෝ මඩුව මේ ලෙසට යි " යන ලෙස සකස් කර ගත් රංග මණ්ඩලෙහි යොමරනු ලබනා ශාන්ති

කර්ම මොනවා ද? (ල 2)

(2) එම ශාන්ති කර්ම පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු 02 බැගින් ලියන්න. (ල 4)

(3) එම ශාන්ති කර්ම වල එන කතා පුවත් තුළින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න. (ල 6)

5. (1) දේශීය නර්තන කලාව හා බැඳි නව ප්‍රවණතා 02 ක් ලියන්න. (ල 2)

(2) එම ප්‍රවණතා සඳහා නර්තන භාවිතා කරන අවස්ථා 02 ක් දක්වන්න. (ල 4)

(3) නව නර්තන නිර්මාණ නර්තන කලාවේ ප්‍රගමනයට කෙසේ හේතුවේදැයි පුවත්පතකට ලිපියක් ලියන්න. (ල 6)

6. (1) වන්නම් රචනයට තුඩු දුන් හේතු 02 ක් ලියන්න. (ල 2)

(2) සම්ප්‍රදායන් තුනෙහිම වන්නම් වල අන්තර්ගතය ලියා දක්වන්න. (ල 4)

(3) සම්ප්‍රදායන් තුනෙහි වන්නම් වල සමාන හා අසමානතා ලියා දක්වන්න. (ල 6)

7. (1) නර්තනය පිළිබඳව රූපවාහිනී වැඩ සටහන් 02 ක් නම් කරන්න. (ල 2)

(2) නර්තනය විචිත්‍රවත් කිරීමට යොදා ගත් උපක්‍රම 02 ක් ලියන්න. (ල 4)

(3) ඔබ දුටු නර්තන අංගය සඳහා අනෙකුත් කලා අංග ඊට සම්බන්ධ වූ අයුරු විමසන්න (ල 6)